# කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## දැන්වීමයි

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (පුනර්) - 2019

**2007 සිට 2016 දක්වා වූ අධ්‍යයන වර්ෂ වල ලියාපදිංචි විද්‍යාර්ථීන්** සඳහා උක්ත පරීක්ෂණය **2023 පෙබරවාරි මාසයේ දී** පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින අතර ඒ සඳහා පෙනී සිටීමට අපේක්ෂා කරන **2007, 2008 සහ 2009** අධ්‍යයන වර්ෂ වල දී ලියාපදිංචි වී ඇති සිසුන් **පමණක්** තම ලියාපදිංචි කාලය දීර්ඝ කර ගත යුතුව ඇත.

එබැවින්, ඔබගේ ශිෂ්‍ය ලියාපදිංචිය තවදුරටත් දීර්ඝ කර ගැනීමට බලාපොරොත්තු වන්නේ නම්, විශ්වවිද්‍යාලයේ අභියාචනා කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා තම අභියාචනාව පහත පරිදි පිළියෙල කර **2022.10.05 දිනට හෝ ඊට ප්‍රථම "ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලෙස මෙයින් දන්වමි.

- සම්පූර්ණ නම
- ලිපිනය
- දුරකථන අංකය
- ශිෂ්‍ය අංකය
- පෙනී සිටීමට ඇති විෂය ඒකක පිළිබඳ විස්තර
- මේ දක්වා උපාධිය සම්පූර්ණ කර නොගැනීමට හේතුව/හේතු

ඉහත දිනට පසුව ලැබෙන අභියාචනා කැලණිය විශ්වවිද්‍යාලීය අභියාචනා කමිටුව වෙත ඉදිරිපත් නොකරන බව ද දන්වා සිටිමි.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,
කැලණිය විශ්වවිද්‍යාලය,
2022.08.27